

2001 ගොඩගේ සාහිත්‍ය උලෙලේ දී - මහවැලි කේන්ද්‍රය - ශ්‍රවණාගාරය



# 1

# අද්‍යතන සිංහල කෙටි නාට්‍ය කලාවේ ප්‍රවණතා පිළිබඳ විමසුමක්

*චන්ද්‍රසිරි බෝගමුව*

The short drama or one-act play is a major genre of modern Sinhala theatre. This genre of drama is staged mostly in drama competitions and festivals. Play producers of younger generation who are keen to make experiments on the stage use this genre as a medium of self expression. Both the content and form of these short dramas have special characteristics of universality and locality in plot, characters and situation and they discuss human problems which are addressed to the deep-rooted emotions of personal and social life.

Based on the writer's observations and research, new trends and the dramatists of the contemporary Sinhala short drama tradition are discussed in this article.

කෙටි කවි, කෙටිකථා, කෙටි නවකථා, කෙටි චිත්‍රපට, කෙටි නාට්‍ය යනුවෙන් හැඳින්වෙන ව්‍යවහාර කීපයක් ශ්‍රී ලාංකේය කලා නිර්මාණ විෂයෙහි දක්නට ලැබේ. ''කෙටි'' යන නාම විශේෂණයෙන් මෙහි දී සංඥා කෙරෙනුයේ දිගින් හෝ ප්‍රමාණයෙන් හෝ කාලය වශයෙන් හෝ අඩු බවයි.

''කෙටි' යන විශේෂණ පදයෙන් කාලයෙන් හෝ ප්‍රමාණයෙන් අඩු බව හඟවන අතර ම සංක්ෂේප වූ ද, සංවිධිත වූ ද ප්‍රබල කලාත්මක ප්‍රකාශන මාදිලියක් පිළිබඳ අදහසක් ද ගම්‍ය වෙයි. කෙටිකථාව, කෙටි චිත්‍රපටය, කෙටි නාට්‍ය යන කලා නිර්මාණ සම්බන්ධයෙන් එම අර්ථකථනය අතිශයින්ම අදාළ වේ. මෙකී කලා ප්‍රවර්ග අතරින් වර්තමාන සිංහල කෙටි නාට්‍ය පිළිබඳ වැඩි දුරටත් කරුණු විමසා බැලීම මෙම ලිපියේ අරමුණයි. මෙහි දී අප විසින් පසුගිය වසර 15ක කාලයක් මුළුල්ලේ නිරඟන ලද සිංහල කෙටි නාට්‍ය පාදක කරගෙන කරුණු සාකච්ඡා කිරීමට අදහස් කරනු ලැබේ.

නාට්‍ය කලාව ලොව පහළ වූ දා සිට නොයෙක් වෙනස්කම්වලට භාජනය වෙමින් විවිධ ස්වරූප ගනිමින් මිනිස් අවශ්‍යතා අනුව හැඩ ගැසුණු බව පෙනේ. යුගයේ අවශ්‍යතාවට අනුව කලාවේ ස්වරූපය හා සීමාවන් තීරණය වේ. සමාජ, ආර්ථික දේශපාලන රටාව වෙනස් වන විට කිසියම් සමාජයක කලාවේ මුහුණුවර ද පරිවර්තනයකට ලක්වේ. ඒ අනුව කිසියම් කලාවක අන්තර්ගතය මෙන් ම ආකෘතිය ද හැඩගැසේ. මෙම අනන්‍යසාධාරණ වෙනසට භාජනය වූ නාට්‍ය කලාව ද ඊට

ආවේණික ආකෘතික හා අන්තර්ගතයන් සහිත ව අද වන විට හැඩ ගැසී ඇත. වර්තමාන කෙටි නාට්‍ය ප්‍රවණතාව ද එබඳු විකාශන ක්‍රියාවලියක එක් අතුරු ඵලයකි.

බටහිර නාට්‍ය සිද්ධාන්තයක් ලෙස ඉදිරිපත් වන ත්‍රිවිධ ඒකත්ව සංකල්පය එනම් කාල ඒකීයත්වය (Unity of time), ස්ථාන ඒකීයත්වය (Unity of place), ක්‍රියා ඒකීයත්වය (Unity of action), යන කාරණාත්‍රය අපේක්ෂිත නාට්‍ය ප්‍රභේදයක් ලෙස කෙටි නාට්‍ය හැඳින්විය හැකි ය. ත්‍රිවිධ ඒකත්ව සංකල්පය අනුගමනය කරමින් රචිත නාට්‍ය ලෙස සොෆොක්ලීස්ගේ "ඊඩිපස් රජ" වැනි පැරණි ග්‍රීක සම්භාව්‍ය නාට්‍ය මෙන් ම ස්ට්‍රින්ඩ්බර්ග්ගේ ''මිස් යුලී'', අතොල් ෆුගාඩ්ගේ "මාස්ටර් හැරල්ඩ්" වැනි නූතන නාට්‍ය නිදසුන් කොට දැක්විය හැකි ය. එහෙත් ඒවා කෙටි නාට්‍ය ලෙස නොසැලකේ.

ඒකාංක නාට්‍ය (One act play) යනුවෙන් හැඳින්වෙන කෙටි නාට්‍ය ප්‍රභේදය තුළ මෙකී ත්‍රිවිධ ඒකත්ව සංකල්පය ගැබ් වී තිබෙනු බොහෝ විට දක්නට ලැබෙන අතර, එය රැකී තිබීම ද අපේක්ෂා කරනු ලැබේ. එහෙත් මෙකී සිද්ධාන්ත බිඳ දමමින් නිර්මාණය වූ කෙටි නාට්‍ය මෑත භාගයේ අපට දක්නට ලැබුණි.

ආර්ථික, දේශපාලන හා සමාජ අවශ්‍යතා පෙරදැරි කරගෙන බිහි වූ විරෝධාකල්ප නාට්‍ය ව්‍යාපාර මෑත කාලීන විකල්ප නාට්‍ය හා කෙටි නාට්‍ය කලාවේ ආරම්භය ලෙස සැලකිය හැකි ය. සම්මත නාට්‍ය ක්‍රමයට අභියෝග කරමින් විවිධ රටවල කෙටි නාට්‍ය ප්‍රභේද බිහිවීම ඇරඹෙන්නේ 20වන සියවසේ සිට ය. අධිරාජ්‍ය විරෝධී, පැසිස්ට් විරෝධී, ඒකාධිපති හමුදා පාලන ක්‍රමවලට විරුද්ධ නාට්‍යකරුවන් මෙන් ම කොමියුනිස්ට්වාදී, මාක්ස්වාදී අදහස් දරූ නාට්‍යකරුවන් ස්වකීය දේශපාලන මතවාද ජනතාව අතර ප්‍රචාරය කිරීමට වීදි නාට්‍ය ප්‍රබල මාධ්‍යයක් ලෙස යොදා ගන්නට පෙලඹුණි.

විදග්ධ නාට්‍ය කලාව අරක්ගත් දුවැන්ත රඟහල්වලින් බැහැරව සාමාන්‍ය ජනයා අතරට නාට්‍ය ගෙනයාමට වෙර දරූ වීදි නාට්‍ය කණ්ඩායම් නිදහස් රංග ශෛලියකින් විවිධ ආකෘති අනුගමනය කළ අතර, ඔවුන්ගේ නාට්‍ය අතර රංග කාලයෙන් කෙටි වූ නාට්‍ය බහුල ව දක්නට ලැබේ. මෙකී ලක්ෂණ ගාමිණී හත්තොටුවේගම, පරාක්‍රම නිරිඇල්ල, එච්.ඒ. පෙරේරා, ඇන්ටන් මිහිඳුකුල ප්‍රමුඛ අනිකුත් වීදි නාට්‍ය කණ්ඩායම්වල වීදි නාට්‍ය ඇසුරින් හඳුනාගත හැකි ය.

කලාත්මක ප්‍රකාශන මාධ්‍යයක් ලෙස කෙටි නාට්‍ය අප රටේ වර්ධනය වීම හා ප්‍රචලිතවීම ඇරඹෙන්නේ 1976න් පසුව ය. ඊට ප්‍රබල දායකත්වයක් ලැබෙන්නේ ජාතික තරුණ සේවා සභාව සංවිධානය කළ සමස්ත ලංකා යෞවන සම්මාන කෙටි නාට්‍ය තරගයයි. ස්වාධීන කලා සංවිධාන, රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන විසින් පවත්වන කෙටි නාට්‍ය තරග, අන්තර් පාඨශාලීය නාට්‍ය තරග, විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගම් විසින් සංවිධානය කළ නාට්‍ය තරග මෑත කාලීන ව කෙටි නාට්‍ය නිෂ්පාදනයට අනුබලයක් සහ අනුග්‍රහයක් දැක් වූ අවස්ථා ලෙස සඳහන් කළ හැකි ය. ආධුනික නවක නාට්‍යකරුවන් උදෙසා පවත්වන නාට්‍ය



වැඩමුළු අවසානයේ දී වැඩමුළු ආශ්‍රිත නිෂ්පාදන ලෙස ද කෙටි නාට්‍ය බිහි වේ. එසේ ම විශ්වවිද්‍යාලවල විද්‍යාර්ථීන් - විශේෂයෙන් ම නාට්‍ය හා රංග කලාව හදාරන සිසු සිසුවියන් - විභාග අවශ්‍යතා සඳහා ඉදිරිපත් කරන නිර්මාණ අතර ද හොඳ කෙටි නාට්‍ය නිෂ්පාදන දක්නට ලැබේ.

සිංහල නාට්‍ය අනුමණ්ඩලය විසින් 1996 සිට 2005 දක්වා දස වසරක කාලය තුළ සංවිධානය කළ රාජ්‍ය කෙටි නාට්‍ය තරගවලට ඇතුළත් වූ නාට්‍ය ඇසුරින් වර්තමාන කෙටි නාට්‍ය ප්‍රවණතා මොනවා දැයි විමසා බැලීමට මෙතැන් සිට ප්‍රයත්න දරන්නෙමු.

සම්මත මහා වේදිකා නාට්‍යයට අමතරව හා විකල්පව විවිධ නාට්‍ය ප්‍රභේද විශේෂයෙන් චූල නාට්‍ය, කෙටි නාට්‍ය වැනි දේ මගින් අපගේ නාට්‍ය කලාව පොහොසත් කිරීමේ අවශ්‍යතාව හඳුනාගත් සිංහල නාට්‍ය අනුමණ්ඩලය 1996 දී ප්‍රථම වරට කෙටි නාට්‍ය තරගයක් සංවිධානය කළේය.

කෙටි නාට්‍ය තරගයක් පිළිබඳ තීරණයට සිංහල නාට්‍ය අනුමණ්ඩලය එළඹියේ විවිධ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන හා පෞද්ගලික සංවිධාන කිහිපයක් විසින් වාර්ෂිකව පවත්වන; තරග ඉලක්ක කරගෙනම වාගේ නිෂ්පාදනය කෙරෙන කෙටි නාට්‍ය සඳහා තවත් වේදිකාවක් ලබාදීමේ හුදු අරමුණ පෙරදැරි කරගෙන ම නො වේ.

සංවිධානය කිරීම හා කළමනාකරණය පහසු කෙටි නාට්‍ය සම්ප්‍රදායක් බිහිවන විට නාටකය සමාජයේ පුළුල් ලෙස පැතිරෙන සුඛනම්‍ය දෙයක් බවට පෙරළෙනු ඇත යන විශ්වාසයෙන් යුතුව සිංහල නාට්‍ය අනුමණ්ඩලය විසින් කෙටි නාට්‍ය තරගය ආරම්භ කරන ලදි. (රාජ්‍ය නාට්‍ය උළෙල, 96)

1995 සිට පත් වූ සිංහල නාට්‍ය අනුමණ්ඩලය විසින් සම්පාදිත තුන් අවුරුදු සැලසුම යටතේ නාට්‍ය නිෂ්පාදනය දිරි ගැන්වීමට, වාර්ෂික නාට්‍ය උත්සවය තව දුරටත් අර්ථවත් කරගන්නේ කෙසේ ද, පොහොසත් කරගන්නේ කෙසේද යන ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට ගත් ව්‍යායාමයේ එක් ප්‍රතිඵලයක් වූයේ කෙටි නාට්‍ය තරගය සංවිධානය කිරීමයි. රාජ්‍ය නාට්‍ය උළෙල 96 සමග මෙම කෙටි නාට්‍ය තරගය පළමුවරට පැවැත්වුණි.

1996-97-98 යන වසරවල කෙටි නාට්‍ය තරගය පවත්වා ඇත්තේ රාජ්‍ය නාට්‍ය උළෙලේ දිගු නාට්‍යවලට සමගාමීව එකම උළෙලක් ලෙස ය. මෙකී වසර තුන සඳහා පිළිවෙලින් කෙටි නාට්‍ය 8-7-12 වශයෙන් අවසාන වටය නියෝජනය කර ඇත. නාට්‍ය අනුමණ්ඩලය කෙටි නාට්‍ය සඳහා වෙනම තරගයක් සංවිධානය කර ඇත්තේ 1999 වසරේ දී ය. පළමුවන රාජ්‍ය කෙටි නාට්‍ය උළෙල ලෙස නාට්‍ය අනුමණ්ඩලය විසින් නම්කර ඇත්තේ මෙම කෙටි නාට්‍ය තරගයයි. එම තරගයට ලැබුණ පිටපත් 146ක් අතරින් දෙවන වටය සඳහා නිෂ්පාදනයට සුදුසු යැයි පිටපත් 62ක් තෝරාගෙන ඇත. දෙවන වටයේ නිෂ්පාදිත නාට්‍ය අතරින් අවසාන වටයට කෙටි නාට්‍ය 16ක් තෝරාගෙන ඇත. (බෝගමුව, 2007, 242)

1999 රාජ්‍ය කෙටි නාට්‍ය උළෙල වෙනුවෙන් නිකුත් කළ සමරු කලාපයෙහි නාට්‍ය අනුමණ්ඩලයේ සභාපති ඊ.එම්.ජී. එදිරිසිංහ මහතා මෙබඳු අදහසක් ඉදිරිපත් කරයි.

"...... කෙටි නාට්‍යයට තේමාගතවන අනුභූතීන් සීමිත පරාසයක් තුළ සුවිශේෂ කුසලතාවකින් හසුරුවා ගැනීමට කෙටි නාට්‍යකරුවා සමත් විය යුතුය. නාට්‍යකරණයට ප්‍රවිෂ්ටයක් වශයෙන් කෙටි නාට්‍ය ආධුනික නාට්‍යකරුවන්ට සුගම වූ මාධ්‍යයක් ලෙස ද මෙරට පමණක් නොව ලෝකයේ වෙනත් රටවල ද විශේෂයෙන් ම බටහිර යුරෝපීය රටවල ජනප්‍රියත්වයට පත් ව ඇත.

කඩතිර එසවුම් වශයෙන් යුරෝපීය රටවල වේදිකාගත වූ කෙටි නාට්‍ය වාණිජමය නාට්‍ය විශේෂයක් ලෙස තව දුරටත් නොසැලකේ. දිගට ම එකම උපරිමයක රැඳීමත්, නාට්‍යයේ නිමාවක් සමගම ක්ෂණික ඒකීය වින්දනයකට පාත්‍රවීමත් දිගු නාට්‍යයකට පහසුවෙන් හසු නොවන සියුම් සරල බීජමය අනුභූතියක් විෂයගත වීමත් කෙටි නාට්‍යයෙහි පෙනෙන විශේෂ ලක්ෂණ කීපයකි.

මෙරට ආධුනික නාට්‍යකරුවන් කෙටි නාට්‍ය උදෙසා කැප කරන කාලය, ශ්‍රමය හා උනන්දුව සමඟ උද්වේගකර අත්දැකීම් නාට්‍ය රංගයක් කෙරෙන ප්‍රකාශනය සලකා කෙටි නාට්‍යය, දිගු නාට්‍ය සමග සමගාමීව යන්නට සලස්සනවාට හා ඒවා දිගු නාට්‍ය සම්ප්‍රදායෙහි තුළ සැඟවුණු නාට්‍ය බවට පත්වනවාට වඩා ස්වීය ව ඔසවා තැබීමේ අදහසින් මේ වසරේ සිට වෙනම රාජ්‍ය කෙටි නාට්‍ය උළෙලක් පැවැත්වීමට නාට්‍ය අනුමණ්ඩලය තීරණය කළේය." (එදිරිසිංහ, 1999, 3)

1999න් පසුව 2000, 2001, 2002 යන වසරවල් සඳහා අඛණ්ඩව වෙනම පැවැත්වූ රාජ්‍ය කෙටි නාට්‍ය උළෙල 2003 වසරේ දී යළිත් රාජ්‍ය නාට්‍ය උළෙලේ දිගු නාට්‍ය සමග එකම උළෙලක් ලෙස පවත්වා ඇත. එම සිරිත 2004 වසරේදීත් ක්‍රියාවට නැංවුණු අතර 2005 දී යළි වෙනම උළෙලක් ලෙස රාජ්‍ය කෙටි නාට්‍ය තරගය පවත්වා ඇත. 2005 රාජ්‍ය කෙටි නාට්‍ය උළෙලේ විශේෂත්වය වන්නේ එවර විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් උදෙසා අන්තර් විශ්වවිද්‍යාලයීය කෙටි නාට්‍ය උළෙල යනුවෙන් වෙනම කෙටි නාට්‍ය තරග අංශයක් රාජ්‍ය කෙටි නාට්‍ය උළෙල සමඟ සංවිධානය කර තිබීම යි. සංඛ්‍යාවෙන් 21ක් වූ වැඩිම කෙටි නාට්‍ය ගණන ඇතුළත් වූ රාජ්‍ය නාට්‍ය උළෙල එයයි.

1996 සිට 2005 දක්වා දස වසරක කාලය තුළ පැවති රාජ්‍ය කෙටි නාට්‍ය තරග දහය තුළ අවසන් වටය නියෝජනය කළ නාට්‍ය සංඛ්‍යාව 126කි. ඒ අතරින් කෙටි නාට්‍ය 111ක පිටපත් රචනා ස්වතන්ත්‍ර නිර්මාණ ලෙස සැලකිය හැකිය. විදේශීය කෙටි නාට්‍ය පරිවර්තන 6ක් හා අනුවර්තන නාට්‍ය 2කි. කෙටිකථා ඇසුරින් සකස් කරගත් නාට්‍ය සංඛ්‍යාව 7කි. ඒ අතරින් 5ක් විදේශීය කෙටිකථාය. දෙකක් දේශීය ලේඛකයින්ගේ කෙටිකථා ඇසුරින් සකස් කරගත් ඒවාය. (බෝගමුව, 2007, 244)

විදේශීය කෙටිකථා පදනම් කරගෙන නිර්මාණය කළ කෙටි නාට්‍ය මෙසේය.

1. **පැරණි මළවුන්** - අධ්‍යක්ෂණය ප්‍රියන්ත කළුආරච්චි, 1999 (මිලාන් කුන්දේරා නම් චෙකොස්ලොවැකියානු ලේඛකයාගේ Old deads should make room for young deads ඇසුරෙනි.)
2. **අශ්වයෙක් එළුවෙක් සහ බැටලුවෙක්** - අධ්‍යක්ෂණය අරුණ ප්‍රියන්ත - 1999 (ඉන්දීය ලේඛක ආර්. කේ නාරායන්ගේ කෙටිකතාවක් ඇසුරෙනි)
3. **නිම්නයක්ම විය** - අධ්‍යක්ෂණය නිරෝෂණ තඹවිට, 1999 (මලයාලම් ජාතික කේ. ටී. මොහොමඩ්ගේ කෙටිකථාවක් ඇසුරෙනි)
4. **පශ්චාත් විලාප** - අධ්‍යක්ෂණය අනුර කිත්සිරි, 2001 (ඉතාලි ලේඛක ඇල්බර්ටෝ මොරේවියා ගේ 'දෙමිනිසා' කෙටිකථාව ඇසුරෙනි.)
5. **අන්තිම පිටුව** - අධ්‍යක්ෂණය යසරත්න රත්නායක, 2004 (රුසියානු ලේඛක මික්හේල් සොෂචෙන්කෝගේ 'පෙලගෙයා' නම් කෙටිකථාව ඇසුරෙනි)

මෙරට ලේඛකයන්ගේ කෙටිකථාවලින් වස්තු බීජය ගෙන නිර්මාණය කළ නාට්‍ය ලෙස **කන්‍යාවිය** (ඇන්ටනී ජයලත් - 1997) හා **මේ නිවසට ගිනි තබන්න** (ආරියවංශ ධම්මගේ 1997) යන නාට්‍ය සඳහන් කළ හැකිය.

විදේශීය නාට්‍ය කෘති මූලාශ්‍රය කරගෙන නිෂ්පාදිත අනුවර්තන හා පරිවර්තන කෙටි නාට්‍ය මෙසේය.

1. **මළගම** - අධ්‍යක්ෂණය ප්‍රීති දිසානායක, 1996 (මුල් කෘතිය විලියම් ස්ටැන්ලි හෝර්ට්න්ගේ The Dear Departed - පරි. උදය ආර්. තෙන්නකෝන් - වැලි පෙට්ටිය සහ සම්භාව්‍ය නාට්‍ය)
2. **කඩදාසි බැලූනය** - අධ්‍යක්ෂණය අජිත් මුරගේ, 1999 (මුල් කෘතිය කිෂිද කිනඕගේ 'කමි ෆුසෙන්' පරි. ආරිය රාජකරුණා - ස්වාභාවික හා විකාරරූපී ජපන් නාට්‍ය එකතුව)
3. **මාරියාව** - අධ්‍යක්ෂණය ඉන්ද්‍රප්‍රිය උදිත කුමාර, 1999 (මුල් කෘතිය ජෝන් මිලින්ටන් සිංජ්ගේ Riders to the sea - පරිවර්තනය උදය ආර්. තෙන්නකෝන් - වැලි පෙට්ටිය සහ සම්භාව්‍ය නාට්‍ය)
4. **සයොනාරා** - අධ්‍යක්ෂණය හේමන්ත ප්‍රසාද්, 2000 (මුල් කෘතිය චිෂිම යුකිඕගේ හන්ජෝ (උමතු තරුණිය) - පරි. ආරිය රාජකරුණා - ස්වාභාවික හා විකාරරූපී ජපන් නාට්‍ය එකතුව)
5. **මම කවුරුවත් නෙවෙයි** - අධ්‍යක්ෂණය අතුල පතිරණ, 2000 (මුල් කෘතිය කිකුචි කං ගේ 'කලහය' නාට්‍යයේ අනුවර්තනයකි. - ජපන් නාට්‍ය සංග්‍රහය, ආරිය රාජකරුණා)
6. **යුද පිටියක සවාරියක්** - අධ්‍යක්ෂණය අනුර ඒකනායක, 2001 (මුල් කෘතිය ස්පාඤ්ඤ නාට්‍යකරු ප්‍රනාන්දු ඇරබල්ගේ Picnic on the battle field - පරි. විජිත ගුණරත්න)
7. **ගමේ ගිම්හානය** - අධ්‍යක්ෂණය, එම්.යූ.ආර්. රූපසිංහ, 2002 (මුල් කෘතිය ඇන්ටන් චෙකොෆ්ගේ Summer in the Country පරි. සුනන්ද මහේන්ද්‍ර - චෙකොව් සන්ධ්‍යාව, 1991)
8. **හිම වැටෙන දිනයක** - අධ්‍යක්ෂණය පී.ඩී. චන්දික පෙරේරා, 2004 (අනුවර්තන) - මුල් කෘතිය සඳහන් නො වේ.

1996 සිට 2005 දක්වා රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසාන වටය නියෝජනය කළ නාට්‍ය 126 අතරින් ඒ ඒ වසරවල හොඳම රචනය, හොඳම අධ්‍යක්ෂණය වෙනුවෙන් සම්මානයට පාත්‍ර වූ **චන්ද්‍රාවතී සමග රාත්‍රියක්, අමාවක ඇවිත්, මුරුගසංවරුසාව, අසම්මතය, ඔබ සාපේක්ෂයි, වාමන රූප, සපත්නී, මොනරු සහ අපි, සොල්දාදුවා සහ සඳ එළිය, ධම්මරතන හරි නරකයි, වැලන්ටයින් එනකං, යුද පිටියක සවාරියක්, සිරිදාසගේ කථාව, ප්‍රේමය නම්, මෙතන රෝස මල මෙතන නටන්න, බල්ලො දෙන්නෙක්, කෝච්චිය එනකං, නිවන් යනකං, රෝසමල, මසාජ්, ප්‍රේමසිරි මිය ගියෝය, ලෝකාන්තයට ආදරය කරන්න, මේ ආදරයට නමක් දෙන්න, බාල්දිය ඔබ එනතුරු බලා සිටී** යන නාට්‍ය අන්තර්ගතය හා ආකෘතිය වශයෙන් සුවිශේෂ ලක්ෂණ ප්‍රකට කරන නිර්මාණයෝ වෙති.

කෙටි නාට්‍යවලට තේමා කරගත් වස්තු විෂය පිළිබඳ විමසා බැලීමේ දී වැඩිපුර දක්නට ලැබෙන්නේ ස්ත්‍රී - පුරුෂ චරිතාන්තර ගැටුම් මගින් මනුෂ්‍ය චිත්ත අභ්‍යන්තරයේ පැන නගින ප්‍රේමය, අනුරාගය, විරහ වේදනාව, ලිංගික මාත්සර්යය, අපේක්ෂා භංගත්වය, හිංසනය, දයාව, කරුණාව වැනි මනෝ භාව ප්‍රකට කිරීමට ගන්නා වෑයමයි. මිනිස් චෛතසිකයේ ගූඪ හා අපූරු ස්වභාවයන් හෙළිදරව් කිරීමට ඇතැම් නාට්‍ය රචකයන් උත්සාහ දරා ඇත. පෞද්ගලික ආත්ම ප්‍රකාශනයට මුල් තැන දෙමින් පිරිමින් - ගැහැනුන් මුහුණ දෙන කිසියම් සිද්ධියක සුවිශේෂ පැතිකඩක් ප්‍රතිනිර්මාණය කිරීමට කෙටි නාට්‍යකරුවා වෑයම් කරයි.

කෙටි නාට්‍යවලට පාදක වූ සුලභ තේමා අතර නීත්‍යනුකූලව විවාහ වූ අඹු සැමියන් අතර ඇතිවන පවුල් ආරවුල්, විවාහකයන්ගේ නීත්‍යනුකූල නොවන, සමාජය අනුමත නොකරන අනියම් ප්‍රේම සබඳතා නිසා පැන නගින අර්බුද, ගණිකා ඇසුර සොයා යන පිරිමි මුහුණ දෙන ගැටලු, ගණිකා වෘත්තියේ යෙදෙන කාන්තාවන් පිරිමි නිසා මුහුණ දෙන ගැටලු ඇතුළත් නාට්‍ය ගණනාවක් දැකගත හැකිවිය.

ස්ත්‍රී - පුරුෂ පවුල් සබඳතා, ලිංගිකත්වය, විවාහ ජීවිතයේ අතෘප්තිකරබව, කාම තෘෂ්ණා දූලෙහි පැටලී අසරණවන මිනිසාගේ ඛේදජනක ඉරණම ආදිය ප්‍රශ්න කරන නාට්‍ය ලෙස **චන්ද්‍රාවතී සමග රාත්‍රියක්** (අධ්‍ය. නලින් ප්‍රදීප් උඩවෙල), **සංහිඳියාව** (අධ්‍ය. නලින් මාපිටිය), **දණ්ඩේ කිරි පතට උරා** (අධ්‍ය. නන්දන අල්ගෙවත්ත), **සපත්නී** (අධ්‍ය. කුසුම්සිරි ලියනාරච්චි), **කබල් ජෝඩුවක්** (අධ්‍ය. ජනක රණසිංහ), **රාජිණී ගැබ්බරයි** (අධ්‍ය. සුමේධ මුණසිංහ), **පශ්චාත් විලාපය** (අධ්‍ය. අනුර කිත්සිරි), **යාදින්නී** (අධ්‍ය. සමන්ත කුමාර ගමගේ), **වතුර කළයක් අරන් එන්නං** (අධ්‍ය. ආනන්ද රංජිත්), **ලෝකාන්තයට ආදරය කරන්න** (අධ්‍ය. වයි. එච්. ලක්ෂි චන්දිමා), **මට දූන් පිස්සු** (අධ්‍ය. ජෙහාන් ශ්‍රී කාන්ත), **සර්පයකු සමග** (අධ්‍ය. සමන්ත කුමාර ගමගේ), **මේ ආදරයට නමක් දෙන්න** (අධ්‍ය. ගාමිණී ජයකොඩි) විශේෂයෙන් කැපී පෙනේ.

ගණිකා වෘත්තියට යොමු වූ කාන්තා චරිත මගින් ස්ත්‍රීවාදය ඉස්මතු කිරීමට වෑයම් කළ **මසාජ්** හා **බාල්දිය ඔබ එනතුරු බලා සිටී**



ප්‍රබල නාටකීය අත්දැකීමක් සාර්ථකව ප්‍රතිනිර්මාණය කිරීමට සමත් වූ කෙටි නාට්‍ය දෙකකි.

යොවුන් ප්‍රේමයේ සුන්දරත්වය හා එය දිනා ගැනීමට පවතින බාධක ගැන විවරණය කරමින් රචිත කෙටි නාට්‍ය කීපයක් මෙසේ ය.

| | |
|---|---|
| **ඔබ සාපේක්ෂයි** | රචනය : ධනංජය කරුණාරත්න |
| **ප්‍රේමය නම්** | රචනය : චාමර දේශප්‍රිය ගුරුගේ |
| **වැලන්ටයින් එනකං** | රචනය : ධනංජය කරුණාරත්න |
| **රූපාගේ ප්‍රේමය සහ ප්‍රේම්ගේ රූපය** | රචනය : චම්පික නිරෝෂ් ධර්මපාල |
| **ත්‍රිකෝණය** | රචනය : එම් සෆීර් |
| **රෝස මල** | රචනය : සංජීව උපේන්ද්‍ර |
| **ඔයයි මායි තනියම** | රචනය : චමිල ප්‍රියංක |

ආදරයේ මිහිරි අත්දැකීම සොයා යන ගැටවරයකුගේ අපේක්ෂා හා රූබර යෞවනියකගේ සිතුම් පැතුම් අතර ගැටුම කදිමට නිරූපණය කළ නාට්‍යයක් ලෙස **ඔයයි මායි තනියම** විශේෂත්වයක් ගනුයේ එමගින් ගැටවර ප්‍රේමයේ චමත්කාරය අපූර්වාකාරයෙන් වහනය කළ බැවිනි. 2005 රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසාන වටය සඳහා වේදිකාගත වු අවස්ථාවෙහි **ඔයයි මායි තනියම** තරුණ, වැඩිහිටි සැමගේ ඉහළම ප්‍රේක්ෂක ප්‍රතිචාරය ලැබූ නාට්‍යයකි.

ආගමික සංස්ථාව හා ගිහි සමාජය අතර පැන නගින අර්බුද තේමා කරගත් නාට්‍ය කීපයක් ද මෙම කෙටි නාට්‍ය අතර දක්නට ලැබේ. මහණ දම් පුරනවා ද සිවුර හැර දමා ලෞකික ජීවිතයේ ප්‍රශ්නවලට මැදිහත් වනවා ද යන ගැටලුවට මැදිවන තරුණ භික්ෂූන් වහන්සේලාගේ මානසික ඝට්ටනය නිරූපිත නාට්‍ය කීපයක් ම උළෙලේ හොඳම කෙටි නාට්‍ය ලෙස ජයග්‍රහණ හිමි කර ගෙන ඇත. භික්ෂුවගේ ලිංගික ජීවිතය පරීක්ෂා කිරීමට වෑයම් කළ නාට්‍ය ද මේ අතර වේ.

රුවන් බණ්ඩාර නරසිංහගේ **අසම්මතය**
සංජීව උපේන්ද්‍රගේ **ධම්මරතන හරි නරකයි**
සරත් කොතලාවලගේ **උන්වහන්සේ වැඩි සේක**
ඇන්ටනී ජයලත්ගේ **ඇවරයි දෑවරයි**
ගාමිණී ජයකොඩිගේ **නිවන් යනකං**

එබඳු නාට්‍ය කීපයකි. භික්ෂුව හා ගිහියන් අතර ගැටුමත්, භික්ෂුව හා සංඝ සමාජය අතර ගැටුමත් විවිධ ස්වරූපයෙන් විවරණය කිරීමට ඉහත කී නාට්‍ය මගින් උත්සාහ දරා ඇත. එහෙත් අන්‍යාගමික පූජකතුමන්ලාගේ ලිංගිකත්වය හෝ මානසික ගැටුම් නිරූපණය කරන කෙටි නාට්‍ය මෙම නාට්‍ය අතර දක්නට නොලැබේ.

සමලිංගික චර්යාවන් පිළිබඳව කතා කිරීමට උත්සාහ කළ කෙටි නාට්‍ය කීපයක් ද අපට හමු වේ. **සිරිපාල තරහ වෙලා** - (උපුල් ජයමාන්න), **ධම්මරතන හරි නරකයි** - (සංජීව උපේන්ද්‍ර) **පෙම්වතා නැතිවෙලා** - (ලක්ෂි චන්දිමා) එබඳු නාට්‍ය තුනකි.

නීතිය, හිරගෙය, සිරකරුවන් ඇසුරින් මිනිස්කම, යුක්තිය, සාධාරණය ප්‍රශ්න කිරීමට වෑයම් කළ **මට පුළුවන්ද මිනී මරන්න** - (ජනක් ද සිල්වා), **කුණු කානුවක් සහ නොම්බර දෙකක්** - (අතුල පතිරණ), **අලුගෝසුවා සහ මරණය** - (අසංක සායක්කාර) යන කෙටි නාට්‍ය කැපී පෙනේ.

ජන වාර්ගික ගැටලුව හෝ යුද්ධය තේමා කරගත් කෙටි නාට්‍ය හමුවන්නේ කලාතුරකිනි. 2000 රාජ්‍ය කෙටි නාට්‍ය උළෙලේ මේ ගැන අවධානය යොමු කළ කෙටි නාට්‍ය දෙකක් දක්නට ලැබේ. සමන් ගාමිණී කුමාරසිංහගේ **මාගේ දේශය අවදි කරනු මැන** සහ සුමේධ මුණසිංහගේ **රාජිණී ගැබ්බරයි** එම නාට්‍ය දෙකයි. උර්මිලා, මීනා, ධර්මන්, මුතිනන් යන චරිත සිය ජාතිකත්වය නිසා සිංහල දේශයෙහි මුහුණ දෙන ගැටලු කීපයක් **මාගේ දේශය අවදි කරනු මැන** නාට්‍යයෙන් විමසා බැලේ.

ආණ්ඩුවේ හමුදාවෙන් පැන යන හේමන්තත් කොටි හමුදාවෙන් පැන යන රාජිණිත් එක්තරා නවාතැන් පලක දී හමුවෙති. ඔවුන් එකිනෙකා විනාශ කිරීමට වෙඩි තබා ගන්නේ නැත. එදිරිවාදිකම් නැත. එකිනෙකාගේ ප්‍රශ්න දෙදෙනා බෙදා ගනිති. ආදරය කරති. දෙදෙනාම ජීවිතයේ තමන් විඳින අමාරුකම් ප්‍රකාශ කරති. රාජිණිලාගේ ඇඟේ බෝම්බ බැඳ කොළඹට එවා රාජිණිලාගේ ජීවිත පුපුරවා දමති. හේමන්තලාගේ රාජිණිලාගෙ ජීවිත තීරණය කරන්නේ වෙනත් අය විසිනි. රාජිණී ගැබ්බරයි කෙටි නාට්‍යයට තේමා වන්නේ එබඳු කතා පුවතකි.

සමන්ත කුමාරගේ **නිම් නැති නිශාව** හමුදා ආධිපත්‍යයට එරෙහිව විප්ලවය විමුක්තිය වෙනුවෙන් සටන් කරන කැරලිකරුවන් පිළිබඳ සිද්ධියක් තේමා කරගත් නාට්‍යයකි. එක්තරා කලෙක දිගු නාට්‍ය අතර සුලභ තේමාවක් වූ මෙය කෙටි නාට්‍යකරුවන් අතර අඩුම අවධානයට ලක් වූ තේමාවක් බව පෙනේ.

තරංග චින්තන දන්දෙණියගේ **හඳුනා ගැනීම** නම් නාට්‍යය ද හමුදා නිලධාරියකු, ඔහුගේ බිරිඳ හා කැරලිකරුවන් කණ්ඩායමක් වටා ගෙතුණු සිද්ධියක් මුල්කරගෙන රචනා වී ඇත. අවුරුදු ගණනාවක් එකම වහලක් යට දීග කෑ තම බිරිඳ කැරලි කණ්ඩායමේ සාමාජිකාවක බව හමුදා නිලධාරියා දැන ගන්නේ අවසාන මොහොතේ දී ය. එවිට තම බිරිඳ කැරලිකරුවන් සමග එකතු වී ඔහුව කොටුකර ගැනීමට උපාය යොදා අවසානය.

සුපුරුදු පවුල් ප්‍රශ්න හා පෞද්ගලික ජීවන ගැටලු වැනි තේමාවලින් මුක්ත වූ නිර්මාණ කීපයක් ද 126ක් වූ කෙටි නාට්‍ය අතර දක්නට ලැබේ. ඉන්දික ෆර්ඩිනැන්ඩුගේ **මුරුගසංවරුසා**, ජනක් ද සිල්වාගේ **භූතයා**, විකුම් සමන්ත විජේසිංහගේ **සම්මානය**, ජගත් චම්පික බෙනරගමගේ **ප්‍රතිමූර්ති**, එබඳු නාට්‍ය කීපයකි. 1997 වසරේ හොඳම කෙටි නාට්‍යය ලෙස සම්මාන ලද මුරුගසංවරුසා නාට්‍යයට විෂය වී ඇත්තේ බුදුන් විසින් වදාළ අනාගතවංශ දේශනාවේ සඳහන් වන මුරුගසං වර්ෂාවට තෙමී විනාශ වන මිනිසුන් පිළිබඳ කතා පුවතයි. එම සංකල්පය දෙස නවතම දෘෂ්ටියකින් බැලීමට ඉන්දික ෆර්ඩිනැන්ඩු උත්සාහ දරා ඇත.



රංග අභ්‍යාස මූලික කරගත් සමූහ රංගනය පෙරටුකොට ගත් ආකෘතිකවාදී නාට්‍යයක් ලෙස ධර්මප්‍රිය ඩයස්ගේ **පොපර් මාමා සහ පින්තූරය** හැඳින්විය හැකිය. බිත්තියක පින්තූරයක් එල්ලීමට උත්සාහ කරන පිරිසකගේ අසාමාන්‍ය චර්යා රටා මෙම නාට්‍යයෙන් නිරූපණය වේ.

2003 වසරේ කෙටි නාට්‍ය උළෙලේ හොඳම අධ්‍යක්ෂණය සඳහා වූ සම්මානය දිනාගත් ලසන්ත ප්‍රැන්සිස් සිල්වාගේ **කෝච්චිය එනකං** සියුම් චරිතාංග නිරූපණයකට වඩා රංග අභ්‍යාස මගින් හැඩ ගැස්වූ රූපණ ක්‍රමවේදයක් අනුගමනය කළ සාමූහික රංගනය කුළුගැන්වූ නාට්‍යයකි. මෙහි රඟපෑ හැම නළුවෙකුම එකිනෙකාට නොපරදින අන්දමින් සිය රංග කාර්යය ඉදිරිපත් කිරීමට යුහුසුලු වූ අයුරු පෙනෙන්නට තිබුණි.

තුසිත ලක්නාත්ගේ **පිස්සන්ට මං ආදරෙයි** (2005) නාට්‍යය ද ප්‍රබල නාට්‍ය අත්දැකීමක් සියුම් රූපණ ක්‍රමයකින් ඉදිරිපත් කිරීමකට වඩා, රංග අභ්‍යාසවල බුහුටිකමින් අසම්මත ලක්ෂණ ප්‍රකට කළ පර්යේෂණාත්මක නාට්‍යයක ආකෘතිය මතු කළ රංගපරම නාට්‍යයකි.

අරුණ ප්‍රියන්තගේ **අශ්වයෙක් එළුවෙක් සහ බැටළුවෙක්** (1999) ආර්. කේ. නාරායන්ගේ මල්ගුඩි දවස කතා මාලාවේ ඇතුළත් කතා පුවතක් ඇසුරින් ඉදිරිපත් කළ නාට්‍යයකි. අනෙකාගේ භාෂාව නොදන්නාකම නිසා ජාති දෙකකට අයත් තරාතිරමෙන්, සිතුම් පැතුම්වලින් සපුරා වෙනස් දෙදෙනෙකු අනවබෝධයෙන් ක්‍රියා කරන අන්දම මේ නාට්‍යයෙන් නිරූපණය කෙරේ.

මිනිස් චරිතවලට අමතරව සත්ව චරිත යොදාගත් නාට්‍ය කීපයක් ද දස වසරක කෙටි නාට්‍ය ඉතිහාසය තුළ අපට හමුවේ. විකුම් සමන්ත විජේසිංහ රචනා කොට අධ්‍යක්ෂණය කළ **සම්මානය** (1998) නාට්‍යයේ ගෝරිල්ලකුගේ චරිතයක් ඇතුළත් වේ. ගෝරිල්ලකු මිනිසකු බවට පත් කිරීමට පර්යේෂණ කරන මහාචාර්යවරයකුත්, දරුවකු නැති සොවින් පෙළෙන ඔහුගේ තරුණ බිරිඳත් ඇය දූලේ දමා ගැනීමට මාන බලන තරුණ මහාචාර්යවරයකුත් වටා මෙහි සිද්ධි දාමය විකාශනය වේ.

ගාමිණී ජයකොඩි රචනා කොට අධ්‍යක්ෂණය කළ **අඬදඩය** (1998) නාට්‍යයේ පාත්‍ර වර්ගයා ලෙස ඤාව්වා, මීයා යන චරිතවල භූමිකා ඇතුළත් වේ. ඔක්ෂාන් විජේරත්නගේ **නස්න** (1998) නාට්‍යයෙහි ද පවුල් සාමාජිකයන් අතර එක් චරිතයක් ලෙස බල්ලකු දක්නට ලැබේ. බැසිල් රත්නවීර රචනා කොට අධ්‍යක්ෂණය කළ **ගොදුර** (2002) පූසා හා මී දෙන යන චරිත දෙක වටා ගෙතුණු සිද්ධියක් නිරූපණය කරයි.

126ක් වූ කෙටි නාට්‍ය අතරින් දේශීය ජන නාටක සම්ප්‍රදාය අනුගමනය කරමින් නාට්‍යධර්මී ලක්ෂණවලින් පිරිපුන්ව නිමැවුණු එකම නාට්‍යය වන්නේ රවීන්ද්‍ර ආරියරත්න රචනා කොට අධ්‍යක්ෂණය කළ **දූරාණය** (2001) නාට්‍යයයි. ගැමි කථා පුවතක් වටා ගෙතුණු මෙහි ගැමියා, ගම හාමිනේ, ආරච්චිල, දෙවියා, යක්ෂයා යන චරිත ඇතුළත් වේ. සබේ ගුරා සහ ගායක කණ්ඩායමක් මගින් කතා පුවත ඉදිරිපත් කෙරේ. **දූරාණය** ජන නාටක සම්ප්‍රදාය අනුව නිර්මාණය වූ ගීතවත් බවින් පිරුණු ට්‍රැජඩි - කොමඩි ගණයේ කෙටි නාට්‍යයකි.

දස වසරක කාල පරිච්ඡේදය තුළ බිහි වූ කෙටි නාට්‍යකරුවන් අතර පරිකල්පනයෙන් පොහොසත් නිර්මාණශීලී රචකයන් කිහිප

දෙනෙකු හඳුනාගත හැකිය. ධනංජය කරුණාරත්න, ඇන්ටනී ජයලත්, සංජීව උපේන්ද්‍ර, අනුර ඒකනායක, අතුල පතිරණ, අනිල් කේ. විජේසිංහ, හේමන්ත ප්‍රසාද්, සරත් කොතලාවල යන නාට්‍යකරුවන් විශේෂ දක්ෂතා පළ කළ නිර්මාණ ශිල්පීන්ය. මේ අය අතරින් ධනංජය කරුණාරත්න හැරුණු විට අනෙක් හැමදෙනාම නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණයට අමතරව රංගනයෙන්ද දක්ෂතා පෙන්වූ නළුවන්ය.

ඉහත කී රචක - අධ්‍යක්ෂවරුන් විවිධ අත්හදා බැලීම් හා පර්යේෂණ කිරීමට වේදිකාව පර්යේෂණ බිමක් බවට පත්කරගෙන තිබුණි. කෙටි නාට්‍ය රචනයේ දී මෙන්ම රූපණයේ සහ අධ්‍යක්ෂණ කාර්යයේ දී නළු නිළියන් මෙහෙයවීමේ දී ද සුවිශේෂ දිශානතීන් ඔස්සේ විකාශනය වූ අත්හදාබැලීම් සිදු කිරීමට ඔවුන් උත්සාහ දරා තිබුණි. එබඳු සාර්ථක උත්සාහයන් ගණනාවක්ම මෙම කෙටි නාට්‍ය අතර දක්නට ලැබේ.

එකම නිළිය තරුණියකගේ හා මහලු කාන්තාවකගේ භූමිකා දෙකක් කෙටි කාලයක් තුළ ක්ෂණයෙන් චරිත දෙකට සමාරෝපය වෙමින් ඉදිරිපත් කළ අවස්ථාවක් හේමන්ත ප්‍රසාද් විසින් රචනා කොට අධ්‍යක්ෂණය කළ **ගතු කියූ ගීතිකා** (1996) නාට්‍යයෙහි දක්නට ලැබුණි. ජුලියානා හා මොරින් යන භූමිකා දෙක ශිරෝමිකා ප්‍රනාන්දු නිරූපණය කළා ය. ඇගේ මුහුණේ එක අර්ධයක් තරුණ බවිනුත් අනෙක් අර්ධය මහලු බවිනුත් දිස්වන අන්දමට අංග රචනය කර තිබුණි. ප්‍රේම් ජයන්ත කපුගේ දක්ෂ ලෙස එම අංග රචනය නිළියගේ මුහුණෙහි යොදා තිබුණි. එමගින් ස්ත්‍රී චරිතයෙහි ස්වරූප දෙකක්, පැති දෙකක් පරස්පර ගති ලක්ෂණ දෙකක් හේමන්ත ප්‍රසාද් විසින් මැනවින් ගෙන හැර දක්වා තිබුණි. තරුණ රූමත් ආදරබර ජුලියානා ලෙස පෙනී සිටින විට ශිරෝමිකා ප්‍රනාන්දු මුහුණේ එම අර්ධය ප්‍රේක්ෂකාගාරයට පෙනෙන ලෙස රඟපෑවා ය. කුරිරු වධකබාරි මාර්තා ලෙස රඟන විට මුහුණේ අනෙක් අර්ධය ප්‍රේක්ෂකාගාරයට ගෙනහැර පෑවා ය. ශිරෝමිකා ප්‍රනාන්දුගේ මෙම ද්විත්ව රංගනය අගය කෙරුණේ ඇයට කුසලතා සම්මානයක් හිමිකර දෙමිනි.

රඟපෑම අංශයෙන් කාන්තාවන් සුවිශේෂ දක්ෂතා ප්‍රකට කළත්, කෙටි නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය යන අංශවලින් ස්ත්‍රී නියෝජනය දක්නට ලැබෙන්නේ සීමිත අයුරිනි. රංගනයෙන් උපරිමයට ගිය කාන්තා දායකත්වය සුලභ වුවත් නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය විෂයයෙහි කාන්තා දායකත්වය දුලභ ය.

රත්නා පුෂ්ප කුමාරි විසින් **යථාර්ථවාදී සිහිනයක්** නමින් රචනය කොට අධ්‍යක්ෂණය කළ නාට්‍යය 2002 රාජ්‍ය කෙටි නාට්‍ය උළෙලේ අවසාන වටය නියෝජනය කළේ ය. වයි. එච්. ලක්ෂි චන්දිමා අධ්‍යක්ෂණය කළ **ලෝකාන්තයට ආදරය කරන්න** 2004 ජාතික නාට්‍ය උළෙලේ හොඳම කෙටි නාට්‍යය හා හොඳම අධ්‍යක්ෂණය දෙවන ස්ථානය යන සම්මාන හිමිකර ගත්තේ ය. බුද්ධි උදානි කාරියප්පෙරුම විසින් රචනා කොට අධ්‍යක්ෂණය කළ **ඒක හීනයක්** කෙටි නාට්‍යය 2004 නාට්‍ය උළෙලේ වේදිකාගත වූ අනෙක් කාන්තා නිර්මාණයයි.



බුද්ධි උදානි ටවර් නාට්‍ය පාසලේ ශිෂ්‍යාවක වූ අතර ලක්ෂි චන්දිමා ටවර් නාට්‍ය පාසලේ හා කැලණිය විශ්වවිද්‍යාලයේ නාට්‍යකරණය පිළිබඳ උපාධිධාරිනියකි.

අධ්‍යක්ෂවරියන්ගේ නියෝජනය වැඩිපුරම දක්නට ලැබෙන්නේ 2005 දී පැවැත්වුණු රාජ්‍ය කෙටි නාට්‍ය උළෙල හා අන්තර් විශ්වවිද්‍යාලයීය කෙටි නාට්‍ය උළෙල පැවති අවස්ථාවෙහි ය. මෙම උළෙලට කාන්තාවන් අධ්‍යක්ෂණය කළ කෙටි නාට්‍ය 4ක් ඇතුළත් විය. ඒ මෙසේ ය.

බුද්ධි උදානි කාරියප්පෙරුම (ටවර් නාට්‍ය පාසල)
- **රාජ්‍ය සේවය පිණිසයි**

ඩබ්. ඩී. සුධර්මලතා (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය)
- **ආදරවන්තයා**

එස්. එච්. රත්නාවලී (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
- **ගවුම් මාරුව**

වයි. එච්. ලක්ෂි චන්දිමා (කැලණිය විශ්වවිද්‍යාලය)
- **පෙම්වතා නැතිවෙලා**

මේ අතරින් පළමු නාට්‍යය හැර ඉතිරි තුනම කැලණිය, පේරාදෙණිය හා සෞන්දර්ය කලා යන විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂිකාවන් අතින් නිර්මාණය වූ ඒවාය. අන්තර් විශ්වවිද්‍යාල කෙටි නාට්‍ය තරග අංශයෙන් හොඳම අධ්‍යක්ෂණය 1 හා 2 යන ස්ථාන පිළිවෙළින් දිනාගත්තේ **ආදරවන්තයා** හා **පෙම්වතා නැතිවෙලා** යන නාට්‍ය අධ්‍යක්ෂණය කළ සුධර්මලතා හා ලක්ෂි චන්දිමා ය.

පර්යේෂණ නාට්‍ය ක්‍රමයක් ලෙස කෙටි නාට්‍ය කලාව විවිධ ස්වරූපයේ විවිධ ආකෘති අනුගමනය කර ඇත. චරිත ගණනාවකින් හෝ චරිත දෙකක් හෝ තුනක් මගින් කිසියම් සිද්ධියක් ඉදිරිපත් කරන නාට්‍ය මෙන්ම තනි චරිතයක් මගින් සුවිශේෂ වූ මොහොතක්, ජීවිතයේ අංශු මාත්‍රයක් ග්‍රහණය කරගත් කෙටි නාට්‍ය ද අපට දක්නට ලැබුණි.

තනි නළුවකුගේ චරිත නිරූපණයෙන් පමණක් විකාශනය වූ කෙටි නාට්‍ය ලෙස රවීන්ද්‍ර ආරියරත්නගේ **අවකේශි** (2000) චමින්ද සමරනායකගේ **බල්ලො දෙන්නෙක්** (2002) සඳහන් කළ හැකි ය. තිලාන් චමරු පතිරණගේ **කාලිදාසට කවි මතක නෑ** (2005) නාට්‍යයෙහි තනි නිළියක විසින් රඟ දක්වන භූමිකාවකින් සම්පූර්ණ නාට්‍යය විකාශනය විය. මෙම නාට්‍යවල විශේෂත්වය වන්නේ නළුවාගේ හෝ නිළියගේ ඒකල භාෂණය මගින් ආත්මකථනයක ස්වරූපයෙන් චරිතයක පැතිකඩක් නිරූපණය වීමයි.

කාව්‍යමය බස් වහරකින් යුත් සංක්ෂිප්ත කවියක් බඳු **කාලිදාසට කවි මතක නෑ** අපූර්ව නාට්‍යමය ප්‍රකාශනයකි. අවුරුදු 40ක් පමණ වයසැති කාලිදසගේ බිරිඳ නිවස තුළ හුදකලාව සිටී. සැමියාගේ කන්තෝරු කාමරය අස් පස් කරන අතරතුර ඇය තම අතීතය මෙනෙහි කරයි. සරසවි ජීවිතය, කාලිදාස (කවියෙකු වූ සරසවි පෙම්වතාගේ ආරූඪ නාමය) එහිදී තමාට පෙම් කවි ලියූ සැටි, ඔහු හා පෙමින් බැඳී විවාහ වූ අන්දම යනාදී අතීත මතක සටහන් අතර සැරිසරමින් තමාගේ

වර්තමාන හා අනාගත සිහින ලොව තුළ සැරිසරයි. කාලිදාසගේ බිරිඳ ලෙස රගපෑ සංගීතා තරංගනී අබේවර්ධන ඒකාකාරිබවක් ඇති නොවන අයුරින් මනා රිද්මයක් පවත්වා ගෙන යමින් අපූරු රඟපෑමක් ඉදිරිපත් කළා ය. එක් චරිතයක් ඇතුළත් නාට්‍යයක් තනි නිළියක විසින් රසවත් ව ඉදිරිපත් කළ නාට්‍යයක් ලෙස **කාලිදාසට කවි මතක නෑ** කැපී පෙනේ.

තනි නළුවකුගේ භූමිකාවක් පමණක් ඇතුළත් කෙටි නාට්‍යවල ඒකාකාරිබව බිඳීමට විවිධත්වය මතු කිරීමට ඇතැම් විටෙක බාහිරින් ඇසෙන කටහඬ (ආකාශ භාෂිත) උපයෝගී කරගෙන තිබුණි. **බල්ලෝ දෙන්නෙක්** නාට්‍යයෙහි කාමරයට කඩා වැදී ඇඳ යට. රිංගාගත් බල්ලකු හා ඌ එලවා දැමීමට වෙහෙසන මිනිසකුගේ ක්‍රියා කලාපය මගින් හුදකලා චරිතයක ගති ලක්ෂණ ප්‍රකට කිරීමට වෑයම් කර තිබුණි. රවීන්ද්‍ර ආරියරත්නගේ **අවකේශි** නාට්‍යයෙන් කාමරයට වැදී හුදෙකලාව පාඩම් කිරීමට වෙහෙසෙන යෞවනයකුගේ මනස ක්‍රියා කරන ආකාරය නිරූපණය කිරීමට ප්‍රයත්න දරයි. මෙහිදී ද පිටතින් ඇසෙන මවගේ කටහඬ වරින් වර ඉදිරිපත් වේ.

තනි චරිත නිරූපණයක් සහිත නාට්‍ය කෙටි නාට්‍යයක් ලෙස පිළිගත හැකි ද? මේ මතය බැරෑරුම්ව මතුවීම නිසා 1999 වර්ෂයෙහි ධනංජය කරුණාරත්න විසින් රචනා කොට අධ්‍යක්ෂණය කළ **ලාස්ට් බස් එකේ කථාවක්** පර්යේෂණාත්මක නාට්‍යය (මෙහි සෞම්‍ය ලියනගේ බස් මගියකුගේ චරිතයක් අපූර්වාකාරයෙන් නිරූපණය කළේය) රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසාන වටයට තෝරා ගෙන නොතිබුණි. තනි චරිතයක් මගින් විවිධ අවස්ථා හා ක්‍රියා ඉදිරිපත් වූ **ලාස්ට් බස් එකේ කථාවක්** නාට්‍යය පර්යේෂණාත්මක නාට්‍යයක් වූ බැවින් සාම්ප්‍රදායිකව පිළිගත් ආකෘතිය තුළම - එනම් අවම වශයෙන් චරිත දෙකක් වත් තිබිය යුතුය යන රාමුවට අයත් නොවූ නාට්‍යයකි.

**එක තන හාමිනේ** (2004) නාට්‍යයේ එක තන හාමිනේ නමැති ගැහැනියගේ භූමිකාව පිරිමියකු (සරත් චන්ද්‍රවංශ) විසින් රඟපා එම වසරේ හොඳම නළුවාට හිමි සම්මානය දිනා ගැනීමත් විශේෂ සිද්ධියකි. එක තන හාමිනේ රචනා කර අධ්‍යක්ෂණය කළේ ද හොඳම නළුවා සම්මානය දිනාගත් සරත් චන්ද්‍රවංශ විසිනි.

ප්‍රබල නාටකීය අත්දැකීම් සෞන්දර්යාත්මකව ප්‍රකාශ කිරීමේ අවස්ථා රාශියක් පසුගිය දස වසරක කෙටි නාට්‍ය ඉතිහාසයෙන් හඳුනාගත හැකිය. කලාත්මක සංයමයෙන් මාධ්‍ය හසුරුවා ගනිමින් සියුම් රස භාව මතු කළ නාට්‍ය ගණනාවක් මේවා අතර දක්නට ලැබේ. **චන්ද්‍රාවතී සමග රාත්‍රියක්, ඔබ සාපේක්ෂයි, වැලන්ටයින් එනකං, වාමන රූප, මොනරු සහ අපි, අසම්මතය, අමාවක ඇවිත්, සොල්දාදුවා සහ සඳ එළිය, යුද පිටියක සවාරියක්, සිරිදාසගේ කථාව, මසාජ්, ලෝකාන්තයට ආදරය කරන්න,** එබඳු නාට්‍ය කීපයකි.

කෙටි නාට්‍ය බොහොමයක සිද්ධිදාමය ගොඩනැගුනේ චරිත දෙකක් හෝ තුනක් හෝ කේන්ද්‍ර කරගෙන ය. **චන්ද්‍රාවතී සමඟ රාත්‍රියක්, අසම්මතය, ඔබ සාපේක්ෂයි, කඩදාසි බැලූනය, භූතයා, කන්‍යාවිය, කුණු කාණුවක් සහ නොම්මර දෙකක්, සපත්නී, උඩු හුළඟක් ඇවිල්ලා,**



**කාමරයයි නුඹයි මමයි, පැරණි මළවුන්, මොනරු සහ අපි, අශ්වයෙක් එළුවෙක් සහ බැටළුවෙක්, නිම්නයක් ම විය, සිරිපාල තරහවෙලා, සොල්දාදුවා සහ සඳ එළිය, ධම්මරතන හරි නරකයි, සජල, අසන්තුලනය, මෙතන රෝසමල මෙතන නටන්න, මං ඔයාට ආදරෙයි, ගොදුර, මට දැන් පිස්සු, සර්පයෙකු සමග, ඔයයි මමයි තනියම, මට පුළුවන් ද මිනී මරන්න, ගවුම් මාරුව, නීතියෙන් තහනම්, මේ ආදරයට නමක් දෙන්න, ඒ මැදියමේ සඳ පායා තිබුණා, ඇඟිල්ලක කතාව, ඒක හීනයක්, ලෝකාන්තයට ආදරය කරන්න, මසාජ්, රෝසමල, ප්‍රේමය නම්, වැලන්ටයින් එනකං, අලුගෝසුවා සහ මරණය, ඇවරයි දැවරයි, සිරිදාසගේ කතාව** යන නාට්‍ය කේන්ද්‍රීය චරිත දෙකක් මගින් ආඛ්‍යානය ගොඩනගා තිබුණි. චරිත දෙක එකිනෙකට වෙනස් අරමුණු ඔස්සේ ක්‍රියාත්මක වීම නිසා ගැටුමක් හට ගනී. එකී ගැටුම තීරණාත්මක මොහොතකින් කෙළවර වේ.

චරිත තුනකින් යුක්ත නාට්‍යවල ආඛ්‍යානය සැකසුනේ ආරම්භයේ දී චරිත දෙකක් තම අපේක්ෂා මුදුන්පත් කර ගැනීමට සැරසෙද්දී තුන්වැන්නෙකු ඊට මැදිහත්වීම නිසා නොසිතූ විරූ අර්බුදයකට ගොදුරුවන ආකාරය විදහා පෑමෙනි. කතා වින්‍යාසයෙහි මෙම ලක්ෂණය දිස්වන නාට්‍ය ලෙස "**යාදින්නී, උන්වහන්සේ වැඩි සේක, පශ්චාත් විලාපය, අමරණීය නොවූ ජීවිතයක්, කබල් ජෝඩුවක්, රාජිනී ගැබ්බරයි, මම කව්රුවත් නෙවෙයි, හංස විලම කැළඹී, පුත්‍ර ආගන්තුකයා, පෙම්වතා නැතිවෙලා, බාඳුරා, වතුර කළයක් අරං එන්නං, ත්‍රිකෝණය**" නම් කළ හැකිය.

එක්තරා අන්දමකට කෙටි නාට්‍ය කලාව විකල්ප රංග සම්ප්‍රදායක් ලෙස අර්ථ දැක්විය හැකිය. තේමාව වශයෙන්, ආඛ්‍යානය වශයෙන්, රංග තාක්ෂණය භාවිතයෙන්, දෘෂ්ටිමය වශයෙන් සම්මත වේදිකාවේ සුලභව දක්නට ලැබෙන සම්මුතිවලින් බැහැරව කෙටි නාට්‍ය නිර්මාණ වේ. "**ඇවරයි දැවරයි**", "**උන්වහන්සේ වැඩි සේක**", යන නාට්‍ය තේමාව වශයෙන් ගත් කල විකල්ප ලක්ෂණ සලකුණු කරයි. **ඇවරයි දැවරයි** නාට්‍යය ලෞකික ලාභ අපේක්ෂා හමුවේ පිරිහුණ සංඝ සමාජයේ පුවතක් වස්තු විෂය කරගනී. ධම්මවංශ (ගිහාන් ප්‍රනාන්දු) තම වයසක දිළිඳු අසරණ මව රැක බලාගෙන සිටින නංගී - රංජනී (ශ්‍රියානි දුණුවිල) හට විවාහයක් කර දීමට යෝජනාවක් ගෙන එයි. මංගල අපේක්ෂකයා වන්නේ පන්සලේ නායකකමට හිමිකම් කියන රංජනී වෙනුවෙන් සිවුරු හැරීමට සූදානම් තරුණ භික්ෂුවකි. ඔහු සිවුරු හැර දමා ගිහි ගෙට පැමිණ නංගි විවාහ කර ගත හොත් තමාට පන්සලේ නායකකම ලබාගෙන, පවුලේ අසරණ තත්ත්වය ජයගත හැකි බව කල්පනා කරන ධම්මවංශ නංගී ඉදිරියේ බැගෑපත් වෙමින් දණින් වැටෙයි. වෙනත් කෙනෙකුට දැනටමත් ආදරය කරන රංජනීගේ ප්‍රේමය වෙන්දේසි කිරීමට පැවිදි සොයුරා බලවත් වෙහෙසක් ගනියි............ "ඇවරයි දැවරයි" නාට්‍යයට ප්‍රස්තුත වන්නේ එවැනි සිද්ධියකි.

**උන්වහන්සේ වැඩිසේක** (2001) අසරණ රෝගී මව හා නැගණියන් දෙදෙනා නඩත්තු කිරීමට සොරකමේ ගොස් ගණිකාවකගේ කරුණාව

නිසා යාන්ත්මින් පණ බේරා ගන්නා චීවරධාරී පුද්ගලයකු (සරත් කොතලාවල) වටා ගෙතුණු කතා පුවතකි. කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් හෝ ආගම දඩමීමා කරගත් පුද්ගලයන් හමුවේ එය ඉවසා වදාරන්නට සමාජ ප්‍රවාහය හමුවේ අසරණ වූ ගණිකාවකට සිදු වේ. ආගම විසින් මිනිසාත්, මිනිසා විසින් ආගමත් අතකොලුවක් සේ යොදා ගන්නා සමාජයක සෑම සියලු දෙනා ම අඩු වැඩි වශයෙන් මේ සමාජ ප්‍රවාහයට ගොදුරු වී ජීවත්වීමට සදාචාර විරෝධී මාර්ගයක ගමන් කරන අයුරු නිරූපිත මෙම නාට්‍යය අර්ථ පූර්ණ සංවාද නිශ්චිත සන්දර්භයක් තුළ විවිධ අරුත් දනවන අයුරින් හසුරුවමින් ප්‍රදර්ශනය කළ විශේෂ රංගනය නිසා කැපී පෙනුණු නාට්‍යයකි.

අතුල පතිරණගේ "සිරිදාසගේ කතාව" (2001) තේමාව වශයෙන් මෙන් ම ආඛ්‍යානය ඉදිරිපත් කළ විලාසය අතින් ද වේදිකාව හා ප්‍රේක්ෂකාගාරය රංගනය සඳහා භාවිත කළ ආකාරයෙන් ද විශේෂත්වයක් ගත් නාට්‍යයකි. රු: 25000කට මිනිසෙකු මැරීමට කොන්තරාත්තුවක් ගන්නා සිරිදාස (අතුල පතිරණ) එම මුදලින් ජීවිතයේ සියලු යස ඉසුරු ලබා ගත නොහැකි බව අවබෝධ කරගනී. අත්තිකාරම් වශයෙන් ලබාගත් රු 5000 මුදල ආපසු දී මෙම මර උගුලෙන් ගැලවීමට සිරිදාස කොතෙක් උත්සාහ කළත් අවට සමාජය ඔහුගේ පිළිසරණට ඉදිරිපත් නොවන නිසා අවසානයේ දී ඔහුට මිනීමරු කොන්තරාත්තුව බාර ගැනීමට සිදු වේ. පසු දා උදෑසන ඔහු භාරගත් කොන්තරාත්තුව අනුව ඇමතිවරයෙකු ඔහු අතින් ඝාතනය වන බවත්, හවස ප්‍රවෘත්ති බලන ලෙස ප්‍රේක්ෂකයාට පවසන ඔහු නින්දට සූදානම් වෙයි. එහෙත් සුවදායි නින්දක් ළඟා නොවන ඔහු බිම පෙරළි පෙරළී කල් මරයි.

''යුද පිටියක සවාරියක්" (2001) ස්පාඤ්ඤ ජාතික නාට්‍යකරු ෆර්නැන්දෝ ඇරබල්ගේ "Picnic on the Battle Field" නාට්‍ය පෙළ ඇසුරින් විජිත ගුණරත්න කළ පරිවර්තනයකි. නිෂ්පාදනය කළේ අනුර ඒකනායක විසිනි. මෙය යුද්ධය නමැති ජාවාරමට ඇත්තේ කුමන හැඩයක් ද යන්න ගැඹුරින් විශ්ලේෂණය කරන නාට්‍යයකි. සංකේතාත්මක චරිත කීපයක් - එකිනෙකාට සතුරු කරවූ දෙපාර්ශ්වයක සමාන සිතුම් පැතුම් ඇති තරුණ සොල්දාදුවන් දෙදෙනෙක්, ඔවුන්ට මැදිවන මහලු මාපිය යුවළක් - යුද පිටියක් තුළ විනෝද සවාරියක් ගත කරන අයුරු නිරූපණය කරමින් යුද්ධය නමැති ජාවාරමට අතුල් පහරක් එල්ල කරන නාට්‍යයකි. 'යුද පිටියක සවාරියක්' තාත්විකත්වය ඉක්මවා ගිය රංග ක්‍රමයක් උපයෝගී කරගෙන යුද්ධයේ බියකරුබවත්, එහි අන්තර්ගත ප්‍රෝඩාකාරී බවත්, ප්‍රීතියෙන් සිටින මිනිසුන්ට එල්ල කරන මාරාන්තික ප්‍රහාරයත්, නාට්‍ය ආකෘතියට අවශ්‍ය වර්ණ ගන්වමින් අනුර ඒකනායක ඉදිරිපත් කරයි.

අප මෙතෙක් දුරට විමංසනයට භාජනය කළ කෙටි නාට්‍ය අන්තර්ගතය වශයෙන් මෙන්ම ආකෘතිය වශයෙන් ද ප්‍රකට කළ විශේෂතා අනුව විවිධ ප්‍රකාශන රීතීන්ට අයත් බව පෙනී යයි. නාට්‍යකරුවා ග්‍රහණය කළ සමාජ යථාර්ථය හෝ පුද්ගල මානසික යථාර්ථය විවිධ රංග රීති අනුව ඉදිරිපත් කර ඇත. නාට්‍යයට වස්තු කරගත් සංකල්පීය අදහස්වල විෂය මූලික හෝ මනෝ මූලික යථාර්ථය



ප්‍රකට කිරීම සඳහා නාට්‍යකරුවන් අනුගමනය කළ ප්‍රකාශන රීතින් මොනවා ද?

නාට්‍ය අනුභූතියක් ලෙස රචකයා ගොනු කරන අදහස තාත්වික රීතියකින් හෝ අධිතාත්වික රංග රීතියකින් ඉදිරිපත් කළ අවස්ථා හඳුනාගත හැකි ය. **චන්ද්‍රාවතී සමග රාත්‍රියක්, ඔබ සාපේක්ෂයි, වැලන්ටයින් එනකං, අසම්මතය, නිවන් යනකං, මසාජ්, ලෝකාන්තයට ආදරය කරන්න** වැනි නාට්‍ය සංවාදය ප්‍රමුඛ සාධකය කරගත් තාත්වික රංග රීතියක් අනුගමය කර ඇත.

සංකල්පීය අදහස් පදනම් කරගත් නාට්‍ය කල්පිතය හා යථාර්ථය සංකලනය වූ අධිතාත්වික හෝ ප්‍රකාශනවාදී රංග රීතියක් භාවිතයට ගෙන ඇත. ඇතැම් නාට්‍යයක් සංකේතවාදය ගුරුකොට ගනිමින් රංග රීතිය හැඩ ගස්වා තිබුණි. **වාමන රූප, මොනරු සහ අපි** වැනි නාට්‍යවල අධිතාත්වික සංකේතවාදී ලක්ෂණ ප්‍රකට වේ. සුනිල් පතිරණ අධ්‍යක්ෂණය කළ **සොල්දාදුවා සහ සඳ එළිය** (2000) ප්‍රකාශනවාදී සංකේතමය රීතියක් අනුගමනය කළ අපූර්ව නිර්මාණයකි. උපතින්ම සෞන්දර්යකාමී මිනිසා යුද්ධය විසින් මානසිකව සිරකර විනාශයට පොලඹවා ඇත. යුද වාතාවරණය විසින් සිරකොට ඇති මානුෂිකත්වය සංකේතවත් කරන්නේ සොල්දාදුවාගේ චරිතය මගිනි. මුරකාවලෙහි යෙදී සිටින ඔහු ඉදිරියට මොනාලිසා පැමිණෙයි. යුද මානසිකත්වයෙන් මිදී ස්වභාව සෞන්දර්ය - සඳ එළිය ආස්වාද කිරීමට කවිය, චිත්‍රය රස විඳීමට සොල්දාදුවාට අවසර නැත. යුද සෙබළාගේ ආධ්‍යාත්මික ඛේදවාචකය **සොල්දාදුවා සහ සඳ එළිය** නාට්‍යයෙන් පිළිබිඹු කෙරේ.

පන්සලේ මකර තොරණේ උන්නත කැටයමක් මෙන් නෙළා ඇති වාමන රූප මිනිස් වෙසක් ගෙන පණ ලබා තොරණෙන් බිමට බැස ඇත. වාමනයෝ තමන්ට ඇති ප්‍රශ්න සාකච්ඡා කරති. අවුරුදු දහස් ගණනක් තිස්සේ තමන් කරගසා ගෙන සිටින මේ සංස්කෘතිය අතහැර දමා අනෙක් මිනිසුන් මෙන් තමන්ට උරුම නිදහස් ලෝකය සොයා යාමට ඔවුහු වෙහෙසෙති. සංස්කෘතිය නිසා යටපත් කරගෙන ඇති හිරකරගෙන ඇති මිනිස් ආසාවන් සන්තර්පණය කර ගැනීමට වෙර දරන චරිත දෙකක් පොඩ්ඩා (වාමන) හා ලොක්කා (වාමන) චරිත දෙක මගින් සංකේතවත් කෙරේ. වාමන චරිත විසින් උරදී දරා සිටින සංස්කෘතිය නමැති මකර තොරණ ඔවුන් අතහැර දමා ගියත් ඊට කරගැසීමට තවත් වාමනයෝ සූදානමින් සිටිති. මෙවැනි සංකල්පයක් අනුව ඇන්ටනී ජයලත් විසින් රචිත **වාමන රූප** (1998) කල්පිතයත් යථාර්ථයත් මනාව සංකලනය කළ සංකේතවාදී නාට්‍යයකි. ඇන්ටනී ජයලත් විසින් රචනා කොට අධ්‍යක්ෂණය කළ **මොනරු සහ අපි** (1999) නාට්‍යය ද අධිතාත්වික ලක්ෂණ ප්‍රකට කළ සංකේතවාදී නාට්‍යයකි. ආර්ථික අඟහිඟකම්වලින් පීඩා විඳින සෝමදාස නමැති ලිපිකරුවා සිහින අපේක්ෂාවන් අතර සැරිසරන මොහොතක රුපියල් දහසේ නෝට්ටුවේ සිටින මොනරා ඔහුට පිහිට වීමට සුරංගනාවියක් මෙන් ප්‍රාදූර්භූත වේ. මෙම සංකල්පය තාත්වික රංග රීතිය ඉක්මවා ගිය රූපණ ක්‍රමයකින් සාර්ථක රංගාලෝකයෙන් වේදිකාව මත ප්‍රතිනිර්මාණය කර තිබුණි.

කෙටි නාට්‍ය බොහොමයක පසුතලය ලෙස ගෘහ අභ්‍යන්තරය - සාලය හෝ කාමරය අඟවන රංගභූමි අලංකරණ භාවිත කොට තිබුණි. නිවසක පරිසරය මවන සුපුරුදු සැරසිලි වන දොර උළුවස්ස, ජනේලය, ඇඳ වැනි රංග භාණ්ඩ වෙනුවට විශේෂ ආකාරයෙන් සකසාගත් පසුතල නිර්මාණ භාවිත කළ කෙටි නාට්‍ය ගණනාවක් තිබුණි. අන්තර්ගතය විසින් ආකෘතිය තීරණය කළ නාට්‍යවල ඊට උචිත පසුතල නිර්මාණ භාවිත කර තිබුණි. **වාමන රූප** නාට්‍යයේ පසුතලය වූයේ මකර තොරණ හා විහාරයේ ප්‍රතිමා ගෘහයට ඇතුළුවන දොරටුවයි. **ධම්මරතන හරි නරකයි** (2000) නාට්‍යයට පන්සල් භූමියේ රාත්‍රි කාලය හඟවන පහන් වැටක් හා බෝ අත්තක් යොදා ගෙන තිබුණි. නිරෝෂන් සංජයගේ **අසන්තුලනය** (2000) සඳහා කෝච්චි පෙට්ටියක ආකෘතියක් හඟවන පසුතල නිර්මාණයක් භාවිත කොට තිබුණි. **යුද පිටියක සවාරියක්** (2001) නාට්‍යය සඳහා යුද බිමක පරිසරය මැවෙන මුර අට්ටාල, බංකර කම්බිවැට බැරල් යොදා නාට්‍යයේ රංග ක්‍රියාව කුළුගන්වන ඊට උපකාරවන පසුතලයක් නිර්මාණශීලි ලෙස ඉදිකර තිබුණි. ප්‍රහාරක ගුවන් යානා බෝම්බ හෙළන විට මුර අට්ටාල බිම ඇද වැටෙන අයුරින් මෙහි පසුතල සකසා තිබුණි.

වර්තමාන කෙටි නාට්‍ය ප්‍රවණතා ගැන කතා කරන විට මංගල සේනානායක නාට්‍යවේදියා විසින් රචනා කොට අධ්‍යක්ෂණය කළ "කෙටි ම කෙටි නාට්‍ය" පිළිබඳව විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත. 1999 අගෝස්තු මස 29 දින ලුම්බිණි රඟහලේ දී වේදිකාගත වූ "කෙටි ම කෙටි නාට්‍ය" මංගල දර්ශනයට මතු දැක්වෙන නාට්‍ය දහය ඇතුළත් විය. **ඔන්න හොරෝ කවි, යක්කුරේ ඉස්කෝලේ, පොඩි සාදු, ඔබ ද මම ද?, දැන්වත් ඇය බිම තියමු, මාර හිත, සාවිත්‍රි + පබාවතී = සීතා, ජීවිතය වගේ ද මරණය, නාග මාණික්‍යය, රාක්ෂයොත් මල් නෙළති.**

මෙම "කෙටි ම කෙටි නාට්‍ය" නිර්මාණය වීමේ පසුබිම මංගල සේනානායක විස්තර කරන්නේ මෙසේය.

"සිංහල සංස්කෘතික ආයතනයේ අනුග්‍රහය යටතේ 1997 වසරේ සිට පවත්වාගෙන ගිය නාට්‍ය පාඨමාලාව සඳහා දිවයිනේ ඈත ගම් දනව්වලින් තරුණ තරුණියෝ විශාල පිරිසක් සහභාගි වූහ. කාලයක් තිස්සේ ඔවුන් විසින් වැඩි දියුණු කරගත් කුසලතා කිසියම් නව නිර්මාණයක් ඔස්සේ එළි දැක්වීමට කල්පනා කරමින් සිටි මට මෙම - "කෙටි ම කෙටි නාට්‍ය" සංකල්පය පහළ විය. ඒ අනුව විනාඩි පහත්, දහයත් අතර කාල පරාසයකින් යුතු කෙටි නාට්‍ය දහයක් රචනා කරන ලදි. මෙම නාට්‍ය දහය ම කිසියම් එක් මූලික තේමාවක් යටතේ ගොනු කිරීමට කල්පනා කළ මම මිනිස් සිතේ ගූඪ සහ අපූර්ව ස්වභාවයන් එළි පෙහෙළි කිරීම මූලික පදනම වශයෙන් ගෙන මෙම නාට්‍ය පෙළගැස්වීමි. එසේම මේ සඳහා කථා වස්තු හෝ සිදුවීම් තෝරා ගැනීමේ දී ජාතකකතා, ජනකතා හා වෙනත් මූලාශ්‍ර කීපයක් ද සත්‍ය ජීවිතයේ සිදුවීම් කීපයක් ද පදනම් කර ගැනිණ" (*සේනානායක, 2007.23*)

ආකෘතිමය අච්චුවක් සකස් කොට අන්තර්ගතය ඊට බහාලීමේ ක්‍රමය වෙනුවට අන්තර්ගතය විසින් ඉල්ලා සිටිනු ලබන නිදහස් ආකෘතියක් තුළ කෙටි නාට්‍යය වැඩෙන්නට ඉඩ සැලැස්වීම මංගල සේනානායකගේ අරමුණ වී ඇත. නාට්‍යයට සම්බන්ධ දැවැන්ත උපාංග ඉවත් කර නාට්‍ය පෙළ රචනය, අධ්‍යක්ෂණය හා රූපණය යන ප්‍රධාන සාධක තුන සාර්ථකව මෙහෙයවමින් ප්‍රේක්ෂකයින්ට උසස් වින්දනයක් හා ප්‍රබල නාට්‍ය අත්දැකීමක් ලබාදීමේ අපේක්ෂාවෙන්, නිශ්චිත රංග භූමියක් හා ප්‍රේක්ෂකාගාරයක් යන්න නොසලකා වේදිකාවක් ඇතිව හෝ නැතිව ඕනෑම ස්ථානයක රඟ දැක්විය හැකි අයුරින් මෙම කෙටි ම කෙටි නාට්‍ය නිර්මාණය වී ඇත.



කෙටි නාට්‍ය විසින් අපේක්ෂා කරන අපූර්ව වූත් සූක්ෂම වූත් රංග ශිල්ප ක්‍රම ඔස්සේ ඇසිල්ලකින් ජීවිතය විනිවිද දකින්නට ප්‍රේක්ෂකයාට ඉඩප්‍රස්තාව සැලසූ කෙටි නාට්‍ය රාශියක් පසුගිය දශකය තුළ අපට නරඹන්නට ලැබුණි. කෙටි නාට්‍යයට යෝග්‍ය කෙටිබව, අන්තර්ගත වස්තු විෂයේ සියුම් විවරණය, සන්දර්භයේ අපූර්වත්වය, ආකර්ශනීය රූපණය, අපූර්ව ජීවන දෘෂ්ටියකින් ජීවිත පරිඥානයක් ප්‍රකට කිරීම රාජ්‍ය සම්මානයට පාත්‍ර වූ නාට්‍යවල නොමද ව සනිටුහන් වී තිබුණි.

දැනට පවතින අභියෝග හමුවේ වඩාත් දියුණු නාට්‍ය සංස්කෘතියක් පෝෂණය කිරීමේ අරමුණ ඇතිව නව මං සොයා යන ගවේෂණයට, අත්හදා බැලීම්වලට කැමති තරුණ කැලට කෙටි නාට්‍ය ව්‍යවහාරය නව මාවතක් විවර කරදෙන බව පැහැදිලි ය.

## පාදක සටහන්


1. **නව මං සොයා**, 1996, රාජ්‍ය නාට්‍ය උළෙල 96 සමරු කලාපය, කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
2. එදිරිසිංහ, ඊ. එම්. ජී. 1999, **රාජ්‍ය කෙටි නාට්‍ය උළෙල** 99 සමරු කලාපය, බත්තරමුල්ල, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
3. බෝගමුව, චන්ද්‍රසිරි, 2001, **කෙටි නාට්‍ය පිළිබඳ විමසුමක්, සංඛ** - රාජ්‍ය නාට්‍ය උත්සව විශේෂ කලාපය, සංස්ඃ චන්ද්‍රසිරි බෝගමුව, බත්තරමුල්ල, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.


## ආශ්‍රිත සමරු කලාප


1. රාජ්‍ය නාට්‍ය උළෙල 97, සංස්. ජේ. අතුකෝරාල, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
2. රාජ්‍ය කෙටි නාට්‍ය ඇගයීම 2000, සංස්. ටියුරින් අබේවික්‍රම, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
3. රාජ්‍ය කෙටි නාට්‍ය උළෙල 2001, සංස්. ටියුරින් අබේවික්‍රම, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
4. රාජ්‍ය කෙටි නාට්‍ය උළෙල 2002, සංස්. දී. දිනපාල, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
5. රාජ්‍ය කෙටි නාට්‍ය උළෙල 2003, සංස්. දී. දිනපාල, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
6. ජාතික නාට්‍ය උළෙල 2004, සංස්. චන්ද්‍රසිරි බෝගමුව, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

7. රාජ්‍ය කෙටි නාට්‍ය උළෙල සහ අන්තර් විශ්වවිද්‍යාලයීය කෙටි නාට්‍ය උළෙල 2005, සංස්. ටෙනිසන් දසනායක, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

## ආශ්‍රිත ග්‍රන්ථ

1. බෝගමුව, චන්ද්‍රසිරි, 2007, **සමකාලීන සිංහල වේදිකාව**, මුදුන්ගොඩ, තරංග ප්‍රකාශකයෝ
2. සේනානායක, මංගල, 2007, **කෙටි නාට්‍ය විමර්ශන**, නුගේගොඩ සරසවි ප්‍රකාශකයෝ.

# 2

# පොළොන්නරු යුගයේ පුරාවිද්‍යාත්මක ස්ථාන ආශ්‍රිත බෞද්ධාගමික ගොඩනැගිලි අවකාශයන්හි පිහිටි මූර්ති හා කැටයම් මගින් නිරූපිත නෘත්‍ය, සංගීත හා නාට්‍ය කලා ලක්ෂණ

*නොයෙල් විජේරත්න*

පැරණි පොළොන්නරු නගරය අක්කර 300ක් පමණ ප්‍රදේශයක පැතිර පවතී. මේ නගරයට ගඩොල් ප්‍රාකාරයෙන් වට වූ ආයතාකාර ස්වරූපයක් ගත් අක්කර 25ක් පමණ භූමි භාගයක් ඇතුළත්ය. එය වටකොට ඇති ගඩොල් ප්‍රාකාරය උතුරෙන් අඩි 3168ක් ද බටහිරින් අඩි 5346ක් ද දකුණින් අඩි 3010ක් ද නැගෙනහිරින් අඩි 5544ක් දිගය. මේ නගරයට ඇතුළු වීමට වාසල් දොරටු 4ක් තිබූ බව පෙනේ. ඇතුළු නගරය කොටස් දෙකකට තවත් ගඩොල් ප්‍රාකාරයකින් වෙන් කොට තිබේ. එහි දකුණු කොටස උතුරු කොටසට වඩා විශාලය. පරාක්‍රම සමුද්‍රයට යාබදව දකුණු කොටස පිහිටා ඇත. තරමක් උස් තලයක පිහිටි මෙම කොටස අඩි 1320ක් දිග අඩි 722ක් පළල සමතලා භූමි භාගයකි. රාජ මාලිගය සහ ඊට අනුබද්ධ රාජකීය ගොඩනැගිලි මෙහි පිහිටා ඇත. නිශ්ශංකමල්ල රජුගේ රාජ සභාවේ අනිකුත් රාජකීය ගොඩනැගිලි පරාක්‍රම සමුද්‍රය අසල ඉදි කොට ඇත. I වැනි පරාක්‍රමබාහු රජුගේ රාජ මාලිගයත් අනෙකුත් රාජකීය ගොඩනැගිලි පරාක්‍රම සමුද්‍රයට තරමක් ඈතින් දකුණු පසට වන්නට පිහිටා තිබේ. මෙම දකුණු කොටසින් උතුරු පසට පිවිසුණු විට හමුවන්නේ බුදු සමයට හා හින්දු සමයට අයත් ගොඩනැගිලි ය. මේවායින් බහුතරය බෞද්ධ ගොඩනැගිලි ය. පොළොන්නරුවේ ඉතාමත් වැදගත් ගොඩනැගිලි සමූහය ඉදි කොට ඇත්තේ දළදා මලුවෙහි ය. චතුරශ්‍රාකාර හැඩය ගත් මේ මලුව තුළ ප්‍රධාන ගොඩනැගිලි එකොළහක පමණ අවශේෂයන් හමුවේ. මින් ගොඩනැගිලි හයක් හඳුනාගෙන ඇත. ඒ ථූපාරාමය, නිශ්ශංක ලතා මණ්ඩපය, අටදාගෙය, හැටදාගේ හා වටදාගේ යනුවෙනි. ඉතිරි ගොඩනැගිලි පහ නම් වශයෙන් නොහැඳින්වේ. මේ චතුරශ්‍රාකාර මලුවට උතුරින් පිහිටි භූමි භාගයෙහි නටබුන් දිස් වෙතත් නිසියාකාර කැණීම් තවමත් එහි සිදු කොට නොමැත. මේ භූමි භාගයට උතුරින් පිට නගරයෙහි උතුරු සීමා ප්‍රාකාරය පිහිටා ඇත. මේ ආකාරයෙන් පොළොන්නරුව නගරයේ තිබෙන ගොඩනැගිලි රාශිය සංක්ෂිප්ත වශයෙන් මෙසේ දැක්විය හැකි ය. (2 ඡායාරූපය)